# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1982/27 - 2016 අගෝස්තු මස 31 වැනි බදාදා - 2016.08.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි.

*මගේ අංකය* : 4/3/1/144.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 725 කළුතර දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සර්වේයර් ජනරාල්ගේ අංක මූ.පි.ක. 4605 දරන සැලැස්මේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.6840 ක් වූ පහත සඳහන් බිම් කැබැල්ල.

**1. කැබලි අංක 01**
ඉඩමේ නම: මෝදරවැල්ල *නොහොත්* කලපුගොඩ වත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 30-40 පමණ වයසැති මිශ්‍ර වගාවක් සහ ස්ථිර ගොඩනැගිලි 4 ක්ද, ස්ථිර ගොඩනැගිලි 2 ක කොටසක් ද, බුදුමැදුරක් සහ වැසිකිලියක කොටසක් ද ඇත; හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.6840.

ඉහත සඳහන් ඉඩමට / පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ඔක්තෝබර් මස 05 වැනි දින පෙ. ව. 10.30 ට කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2016 සැප්තැම්බර් මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ පරවශ්‍යතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. ඉඩමට ඇති තම අයිතිය සනාථ කිරීම සඳහා අදාළ ඔප්පු, ප්ලෑන් සහ අනෙකුත් ලියවිලි පරීක්ෂණ දිනයේදී ඉදිරිපත් කල යුතුය.

බුද්ධිකා රුවනි සමරතුංග,
ප්‍රාදේශීය ලේකම්,
කළුතර.

2016 අගෝස්තු මස 29 වැනි දින,
කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

09-638

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : 3/3/2/54.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: LD/05/2009/PC/92.

ඉඩම් අත්කරගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අංක 1844/46 හා 2014.01.06 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද හිමිකම් පරීක්ෂණය පැවැත්වෙන දිනය 2014.03.19 දින පෙ.ව. 10.00 වශයෙන් සඳහන් වුව ද, එය 2016.10.12 දින පෙ.ව. 09.00 යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

ජී. එස්. කේ. කන්නන්ගර,
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,
2016.08.29.

09-639

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.